ආයතනයේ නම -රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் – பதிவாளர் நாயகத் திணைக்களம்

பாராளுமன்றத்தில் அரச கணக்குகள் பற்றிய செயற்பாட்டுக்குழுவினால் சபைக்கு வழங்கப்பட்ட அறிக்கை சம்பந்தமாக நிரந்தர கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்பு மற்றும் எடுக்கப்படும் நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Name of the Institution – Registrar Generals' Department**

**Submission of the Observations of Honorable Minister and the steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order 119(4).**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119 (4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183

දෙපාර්තමේන්තුව : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

| | රා.ගි.කා.සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම් | ගණන් දීමේ නිලධාරි විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ නියමිත දිනට ඉදිරිපත් කර නැත. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇතත්, වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබූ බැවින් එම වාර්තාව සමඟ ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදීම. | 2022 වර්ෂයේදී වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට පියවර ගැනීම. |
| 2 | පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | පසුගිය වර්ෂවල පැවති ප්‍රායෝගික අපහසුතා නිසා පුද්ගල පඩිනඩි ලේඛන යාවත්කාලීන කර නොතිබුණු අතර, එම පුද්ගල පඩිනඩි ලේඛන යාවත්කාලීන කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදෙන ලදි. | 2020 හා 2021 වර්ෂවල පුද්ගල පඩිනඩි ලේඛන සම්පූර්ණයෙන්ම යාවත්කාලීන කර ඇත. 2022 පුද්ගල පඩිනඩි ලේඛන යාවත්කාලීන කරමින් පවතී. |
| 3 | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | කඩිනමින් අදාල ලේඛන යාවත්කාලීන කිරීමට ආයතන අංශයට හා ගිණුම් අංශයට උපදෙස් ලබා දීම. | වාහන සම්බන්ධව හානි පාඩු ලේඛනය පවත්වා ගෙන යනු ලබන අතර, හානි පිළිබඳ ලේඛනය පවත්වා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| 4 | 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරෙ රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පලමු, දෙවන හා තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස් පරිදි අදාල මුරපද තුන් මසකට වරක් වෙනස් කරන ලෙස මාණ්ඩලික හා විෂය නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | මේ වන විටත් අදාල මුරපද වෙනස් කර ඇති අතර වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු, දෙවන හා තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| 5 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 50 ක්, කලාප කාර්යාල 7ක් සහ දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාල 17ක් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල 330 ක් දෙපාර්තමේන්තු රාජකාරි කටයුතු සිදු කරන අතර, විගණන විමසුමට අදාළ කාර්යාල වලින් අප්‍රමාදව තොරතුරු ලබාගෙන විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමට පියවර ගෙන ඇත. | හැකිතාක් දුරට ප්‍රමාදයකින් තොරව පිළිතුරු ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. |
| 6 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මාණ්ඩලික නිලධාරි රැස්වීම්වලදී හා ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී නියමිත දිනට අභ්‍යන්තර විගණන විමසුම් සඳහා අදාල කාලච්ඡේදය තුල පිළිතුරු ලබා දෙන ලෙස ප්‍රධාන කාර්යාලය ඇතුළු උප කාර්යාල වල නිලධාරීන් දැනුවත් කිරීමට උපදෙස් ලබා දීම. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු යැවීමට කටයුතු කරන අතර ප්‍රගතියක් අත්කර ගනිමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| 7 | 2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාහන මිලදී ගැනීම, ගොඩනැගිලි මිලදී ගැනීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | 2021.12.31 දිනට වාහන පිළිබඳ යාවත්කාලීන තොරතුරු 2022.10.12 දින ඉදිරිපත් කර ඇත. ගොඩනැගිලි පිළිබඳ තොරතුරු (2021.12.31 දිනට) 2022.12.31 දින යවා ඇත. |
| 8 | 2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොතිබුණි. | රටේ පැවති වසංගත තත්වය නිසා නියමිත දින වලදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇති අතර, නියමිත දින වලට පෙර භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2021.06.30 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |
| 9 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාලවකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් ඌනතා, අතිරික්ත හා නිර්දේශ සම්බන්ධයෙන් කටයුතු නිසි පරිදි සිදු වී නොමැති බැවින් ඒවා නිසි පරිදි සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල නිර්දේශ සම්බන්ධයෙන් සහ අතිරික්ත, ඌනතා සම්බන්ධයෙන් කටයුතු කිරීමට පියවර ගෙන ඇත. |
| 10 | වාහනයක් ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | අපහරණය කිරීම සඳහා සුදුසු වාහන හඳුනාගෙන එම වාහන අපහරණය කිරීම සඳහා කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | අපහරණය සඳහා හඳුනාගෙන ඇති PB-4888, PB-4896, PB-4898 යන වාහන අළුත්වැඩියා කර ගත හැකි ආයතනයක් වෙත ලබා දීමට කටයුතු කරන ලෙස ලබා දුන් උපදෙස් වලට අනුව ආරක්ෂක අමාත්‍යාංශයට පවරා දීමට අවශ්‍ය කටයුතු අවසන් කර ඇත. |
| 11 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරි.චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් අනුව වාහන වල ඉන්ධන ධහනය වීම පිළිබඳ පරීක්ෂාවක් සිදු කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | 2021 වර්ෂයේදී කොවිඩ් වාතාවරණය නිසා රට වැඩි කාල සීමාවක් වසා තැබීම නිසා දෙපාර්තමේන්තු වාහන ධාවනය නොවීම හා 2022 වර්ෂයේදී පැවති ඉන්ධන හිඟය නිසා හා වර්තමානය දක්වාම ඉන්ධන කෝටාවට ඉන්ධන ලබා ගැනීම නිසා වාහන වල ඉන්ධන ටැංකි මුළු ධාරිතාවයට පිරවිය නොහැකි නිසා ඉන්ධන පරීක්ෂාවන් කිරීමේ හැකියාව තවමත් ලැබී නැත. |
| 12 | නියමිත දිනයට බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 50 කින් කලාප 07 කින් සහ දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාල 17 කින් ආදායම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට බැර කරනු ලබන අතර, මහජනතාවගේ සේවාවන් සපුරාගැනීම සඳහා මහජනතාවද මෙම ගිණුමට ආදායම් බැර කරනු ලබන බැවින් බැංකු සැසඳුමේ කාර්යය සංකීර්ණ වී ඇත. එසේ වුවද චක්‍රලේඛ වල සඳහන් පරිදි බැංකු සැසඳුම් ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස නිලධාරීන්ට දන්වා ඇත. | බැංකු සැසඳුම් පිළියෙල කිරීම සංකීර්ණ වුවද නියමිත පරිදි බැංකු සැසඳුම් පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 13 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි. | රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට ආදායම් ගිණුම් ගත වීම සංකීර්ණ තත්වයක පවතින අතර, බැංකු ගිණුමට ලැබීම් වශයෙන් සටහන් වන ලැබීම් මසක් තුලදී නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. බැංකු ගිණුමේ සංකීර්ණත්වය මත නිකුත් කල නමුත් ඉදිරිපත් නොකල මාස 06 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | ගැලපුම් කල යුතු ශේෂ ගැලපුම් කිරීමට පියවර ගෙන ඇත. |
| 14 | මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයටකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකර ගෙන තිබුණි. | මු.රෙ. 94(1) අනුව හැකි සෑම අවස්ථාවකම හැකිතාක් කටයුතු කරන ලෙසත්, කාර්යාල 70 ක පමණ කටයුතු කරගෙන යාමේදී අත්‍යවශ්‍යම කරුණු සඳහා පමණක් මු.රෙ. 94(2) පරිදි කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | දෙපාර්තමේන්තුවේ අත්‍යවශ්‍ය රාජකාරී කටයුතු සඳහා මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන මාරුකර ගැනීමට සිදු වී ඇති අතර එය පාලනය කිරීමට පියවර ගෙන ඇත. |
| 15 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | මාසික හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා සුදුසු පියවරයන් ගන්නා ලෙසත්, මෙහි ප්‍රගතිය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කිරීමටත් පියවර ගෙන ඇත. | 2022 වසර තුල රු. 2,479,473.40 ක හිඟ මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර තව දුරටත් අයකර ගැනීමට ඇති හිඟ මුදල රු. 1,716,800.39 වේ. මෙම මුදල තවදුරටත් අයකර ගැනීමට නොහැකි නම් කපා හැරීමට කටයුතු කිරීම. |
| 16 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | කාර්යාල 70 ක පමණ කටයුතු සඳහා අතුරු අග්‍රිම ලබා දෙන අතර එය අදාල කාර්යය නිමවී මාසයක් ඇතුලතදී නිරවුල් කිරීමට අදාල උපදෙස් ලබා දී ඇත. | 2023 වර්ෂයේ සිට අදාල කාර්යය නිම වී මසක් ඇතුලත නිරවුල් කර ගැනීමට පියවර ගැනීම. |
| 17 | සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්යාල ගණන වැඩි වීම නිසා අදාල වාර්තා ලබා ගැනීමට ප්‍රායෝගික ගැටළු පැමිණෙන බැවින්, නියමිත දිනට අදාල වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. කෙසේ වෙතත් නියමිත දිනට පෙර අදාල වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. | මෙම කාර්යය සාධන වාර්තාව සැකසීමට දිප ව්‍යාප්ත කලාප කාර්යාල, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් තොරතුරු රැස් කිරීමට සිදුවේ. රටේ පැවති කොරෝනා වසංගත තත්වය, ඉන්ධන අර්බුදය සහ නිලධාරීන්ගේ සේවා මුර ක්‍රමය යටතේ රාජකාරියට වාර්තා කිරීම හේතු කොට ගෙන කාර්යය සාධන වාර්තාව සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත සහ තොරතුරු රැස් කිරීමේදී ප්‍රමාදයක් සිදු විය. කාර්යසාධන වාර්තා සහ අනෙකුත් වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීම සඳහා යාවත්කාලීන කරනු ලබන සිවිල් ලියාපදිංචියට හා ඉඩම් හා ලේඛන ලියාපදිංචියට අදාලව දත්ත පද්ධතියක් ස්ථාපිත කරනු ලැබීය. මේවන විට කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. |

.........................................
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

P. S. P. Abeywardhana
Registrar General
Registrar General Department
234/A3, Denzil Kobbekaduwa Mawatha,
Battaramulla

.........................................
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

එල්. ඒ. එස්. ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

## ලේකම්තුමාගේ නිර්දේශය

රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්ට උපදෙස් ලබා දී ඇත.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
ස්වදේශ කටයුතු අංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග මගින් 2023 වර්ෂය තුළ දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟාකර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)
අග්‍රාමාත්‍යතුමා සහ
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍ය.